සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ..............................

## 52 නර්තනය (දේශීය) - I

කාලය පැය 02 යි

- අංක 01 - 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.
- උපදෙස් :- මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

01. "ඇත සිට පෙරුමන් පුරාගෙන" මෙම කවිය ගැයීමේදී වාදනයට සුදුසු බෙරපදය තෝරන්න.
(1) දොං පිංත ගත දොංත (2) දොං දොං පිං පිං ගජිගත (3) දෝං පිං පිං තකට දොංතක
(4) පිංගත ගොගො (5) තකුක්කු පිං පිං කඩතක (..........)

02. "ආසියාවේ නාට්‍ය හා නර්තන කලාව" සහ "බැලේ ඔපෙරා ගීත නාට්‍ය සහ මුද්‍රා නාට්‍ය" යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ,
(1) මුදියන්සේ දිසානායක මහතා සහ ආරියරත්න කළුආරච්චි මහතා විසිනි.
(2) සරත් විජේවර්ධන මහතා සහ බුද්ධි කල්‍යාණි මහත්මිය විසිනි.
(3) තිස්ස කාරියවසම් මහතා සහ ගයාති දීපිකා මහත්මිය විසිනි.
(4) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා සහ ජයසේන කෝට්ටෙගොඩ මහතා විසිනි.
(5) ලයනල් බෙන්තරගේ මහතා සහ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසිනි. (..........)

03. කෝකිල සහ මයූර සංදේශ කාව්‍ය අයත් යුග වන්නේ,
(1) කෝට්ටේ සහ දඹදෙණිය ය. (2) කෝට්ටේ සහ ගම්පොළ ය. (3) මහනුවර සහ ගම්පොළ ය.
(4) කුරුණෑගල සහ කෝට්ටේ ය. (5) දඹදෙණි සහ කෝට්ටේ ය. (..........)

04. "කුඳ කුඳ කුඳ තත් තත් තත් තත් කුඳ කුඳ කුඳ ගත්ත කුදිත ගත ......." යන අඩව් කොටස දක්නට ලැබෙන්නේ,
(1) සිංදු මාත්‍රයේ ය. (2) යාදිනි මාත්‍රයේ ය. (3) දළුමුර පාලියේ ය.
(4) මුල් මාත්‍රයේ ය. (5) සමන් දෙවි මල් අස්නෙහිය ය. (..........)

05. පැරණි සම්මත සිරිත අනුව ගැටබෙරය සැකසීමේදී "හෙණ" යෝගය භාවිතා කළේ,
(1) ගස කැපීමට ය. (2) බෙර කඳ ලියවීමට ය. (3) බෙර කට ගැමට ය.
(4) සම් යෙදීමට ය. (5) වර පටි ඇදීමට ය. (..........)

06 මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් මෝල්ගස් නැටුම ප්‍රථමයෙන් වේදිකාවට හඳුන්වා දුන් වර්ෂය වන්නේ,
(1) 1980 (2) 1982 (3) 1984 (4) 1986 (5) 2005 (..........)

07 පහතරට නර්තන සම්ප්‍රදායේ වෙස්මුහුණු භාවිතා නොකර, අංග රචනා ක්‍රමවේද භාවිතයෙන් ඉදිරිපත් කරන චරිත කිහිපයකි.
(1) වෙඩි සන්නිය කළු යකා සහ මරු සන්නිය (2) කොර සන්නිය තොටයකා සහ ලිච්ඡවි
(3) රිරියකා වඩිගපටුන සහ ගොළු සන්නිය (4) ගුල්ම සන්නිය අභිමානයකා සහ කළුයකා
(5) මරු සන්නිය වඩිග පටුන සහ ලිච්ඡවි (..........)

08 ප්‍රථම රාජ්‍ය සංස්කෘත දූත කණ්ඩායම ඉන්දියාවට යවන ලද වර්ෂය වන්නේ,
(1) 1943 (2) 1947 (3) 1949 (4) 1952 (5) 1959 (..........)

CamScanner

09 "ඈත කඳුකර හිමව් අරණේ" ..... මෙම පසුබිම් ගීතය අන්තර්ගත මුද්‍රා නාට්‍යය සහ ගායකයා ඇතුළත් වරණය වන්නේ,

(1) කරදිය හා ලයනල් අල්ගම (2) නළ දමයන්ති හා ඩබ්. ඩී. අමරදේව.
(3) තිත්තබත හා ලයනල් අල්ගම (4) කරදිය හා වපිරා චිත්‍රසේන
(5) නළ දමයන්ති හා ලයනල් අල්ගම (..........)

10 තාක්කු තකපිපිකුඳ දොහොකඩ තහකඩ තක පිපිකුඳ .... යන අඩව්ව නර්තනය කළ හැකි තිත් රූපය නම්,

(1) මැදුම් මහ දෙතිත (2) සුළු මහ දෙතිත (3) සුළු මැදුම් දෙතිත
(4) මැදුම් තනි තිත (5) තුන්සුළු මහ සිව් තිත (..........)

11 අද්භූත සහ වීර රසයන්හි භාව වන්නේ,

(1) විශ්මය සහ උත්සාහ ය. (2) කරුණ සහ රති ය.
(3) භය සහ ජුගුප්සා ය. (4) ක්‍රෝධ සහ උත්සාහ ය.
(5) ශෝක සහ පිළිකුල් ය. (..........)

12 බුලත් පදය හා කොතල පදය නර්තනය කරන තාලරූප වන්නේ පිළිවෙලින්,

(1) මාත්‍රා 3 + 3 හා 3 + 4 ය. (2) මාත්‍රා 2 + 4 හා 3 + 3 ය.
(3) මාත්‍රා 2 + 3 හා 4 + 4 ය. (4) මාත්‍රා 4 + 4 හා 3 + 3 ය.
(5) මාත්‍රා 3 + 4 හා 2 + 3 ය. (..........)

13 උඩරට හා පහතරට ප්‍රදේශවලට ආවේණික වූ, කාන්තාවන් වෙනුවෙන් පවත්වනු ලබන ශාන්තිකර්ම දෙකකි.

(1) කඩවර කංකාරිය හා පූනාමඩුව (2) කුමාර සමයම හා රිද්දි යාගය
(3) කොහොඹාකංකාරිය හා රටයකුම (4) කඩවර කංකාරිය හා රිද්දි යාගය
(5) කළුකුමාර සමයම හා කුමාර සමයම (..........)

14 සිවිලි වලං සහ උනුනු පියන යන රංග සැරසිලි භාවිතා කරන ශාන්තිකර්ම වන්නේ,

(1) වළියක් මංගල්‍යය හා දහඅට සන්නිය යි.
(2) රටයකුම හා කිරිමඩුව යි.
(3) කිරිමඩුව හා සන්නියකුම යි.
(4) සූනියම් යාගය හා කිරිමඩුව යි.
(5) වළියක් මංගල්‍යය හා රටයකුම යි. (..........)

15 "කාල මූර්තු බලිය" පවත්වනු ලබන්නේ කුමන ග්‍රහයාට ද?

(1) සඳු ට ය. (2) කුජ ට ය. (3) හිරු ට ය.
(4) සිකුරු ට ය. (5) කේතු ට ය. (..........)

16 කුංතක තරිකිට කුඳ ගත කුකුතක ..... මෙම අලංකාර බෙර පදය වාදනය කළ හැකි තිත් රූපයකි.

(1) මහ තනි තිත (2) මැදුම් තනි තිත (3) සුළු මැදුම් දෙතිත
(4) මැදුම් මහ දෙතිත (5) සුළු තනි තිත (..........)

17 වලියක් මංගල්‍යය ශාන්ති කර්මයේ අලුත්නුවර දේවාලය අසළ පරම්පරාවට හිමි වී ඇති රාජකාරිය නම්,

(1) ආවැන්දුම, මල්පදය හා කීල පන්දම් නැටීම ය.
(2) ගුරුගේමාලාව, මහා යක්කම හා ගරායකුම නැටීම ය.
(3) කාලියාම, කීලපන්දම හා මල්පදය නැටීම ය.
(4) කීල බැඳීම, කාලියාම හා ගරායකුම නැටීම ය.
(5) ගරායකුම, පස්පදය හා කීල බැඳීම නැටීම ය. (..........)

18 දේශිය තාල පද්ධතියේ සුළු මැදුම් දෙතිතට සමාන භාරතීය නර්තනය හා සබැඳි කර්ණාටක හා හින්දුස්ථානී තාල වනුයේ,

(1) ඛණ්ඩ ජාති හා ඣප් ය. (2) ත්‍රිශ්‍ර ජාති හා දාදරා ය. (3) මිශ්‍රචාපු හා ත්‍රිතාල් ය.
(4) චතුස්‍ර ජාති හා කෙහෙර්වා ය. (5) ඛණ්ඩ ජාති හා දීප්චන්දි ය. (..........)

CamScanner

19 අතීතයේ (ගල් යුගයේ) භාවිත අංග රචනා ද්‍රව්‍ය දැක්වෙන වඩාත්ම නිවැරදි වරණය වන්නේ,
(1) ගඩොල් කුඩු, කෝපි කුඩු හා පොල්කටු අඟුරු
(2) කොකුම්, පියර, හා කස්තුරි
(3) සඳුන්, දියසායම් හා පහන් දූලි
(4) ගස් පොතු, තේ කොළ හා අල්ලියාදු කුඩු
(5) ගඩොල් කුඩු, කිරිමැටි හා බුලත්විට (..........)

20 ලී කෙලි හා පතුරු නැටුම් සම්බන්ධ ගායනා වලදී වන්දනාමාන කෙරෙන දෙවිවරුන් නම්,
(1) කතරගම හා පත්තිනි ය. (2) නාථ හා විරමුණ්ඩ ය. (3) දඩිමුණ්ඩ හා විෂ්ණු ය.
(4) පත්තිනි හා දෙවොල් ය. (5) සමන් හා කතරගම ය. (..........)

21 A  B 

ඉහත A හා B රූප වලින් දක්වෙන්නේ පිළිවෙලින්,
(1) ගොළු හා ගිනිජල් සන්නි වේ. (2) මරු හා ගුල්ම සන්නි වේ. (3) මරු හා කණ සන්නි වේ.
(4) වැදි හා කොර සන්නි වේ. (5) වැදි හා දේව සන්නි වේ. (..........)

22 රුසියාවේ ප්‍රථම බැලේ පාසල ස්ථාපිත කිරීමට අනුග්‍රහය ලබා දුන් රජු වන්නේ,
(1) ඇලෙක්සියස් ය. (2) IV වන ලුවී ය. (3) මහා පීටර් ය.
(4) අටවන හෙන්රි ය. (5) දෙවන හෙන්රි ය. (..........)

23 පහත සඳහන් වරණ අතරින් මධුපුරේ කවි පාදයක් වන්නේ,
(1) ආල වඩන රුවන් දුන්න....... (2) සිහින් සිනිඳු සළුව පැළඳ....
(3) අනේ මී මැස්සේ මල් රොන් ...... (4) සියොපත් පතිනේ දිගු නුව නෙතිනේ.......
(5) ඉනේ සවඩි රන් කෙඳිවන්........ (..........)

24 පරිභ්‍රමණ පහන, ක්ෂණ පහන යන නම් වලින් හැඳින්වෙන්නේ,
(1) ස්ට්‍රිප් පහන ය. (2) යොමු පහන ය. (3) ස්ට්‍රොබ් පහන ය.
(4) ධාරා පහන ය. (5) අල්ට්‍රා වයලට් පහන ය. (..........)

25 අඩි 46ක් උස් වූ විශාල විවෘත වේදිකාවකින් යුත් සුප්‍රකට ග්ලෝබ් රඟහල නිර්මාණය කරන ලද්දේ,
(1) රවීන්ද්‍රනාත් ටාගෝර් විසිනි. (2) එළිසබෙත් රැජින විසිනි. (3) මහා පීටර් රජු විසිනි.
(4) ඇලෙක්ෂියස් රජු විසිනි. (5) විලියම් ශේක්ෂ්පියර් විසිනි. (..........)

● අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

26 වර්ණ අගමෙහෙසිය හා සම්බන්ධ කථාපුවත අයත්වන්නේ ............................................ ශාන්තිකර්මයට ය.

27 දේව ශාන්තිකර්ම ආරම්භයේදී කප රැගෙන එන පෙරහැරෙහි ගමන් ආරම්භ කරන පදය හඳුන්වන්නේ ..................................................... ලෙස ය.

28 උඩැක්කියේ දෙපස වලයම් තද කර ගැනීම උදෙසා .................................... නමින් හඳුන්වන දවයෙන් සකස් කළ කුඩා කොටසක් භාවිතා කරයි.

29 නර්තන ප්‍රභවය හා බැඳි "නර්තනයේ කථාන්තරය" නම් ග්‍රන්ථය ................................. පඬිවරයා විසින් රචනා කරන ලදී.

30 උඩරට නර්තන සම්ප්‍රදායේ දහනම වන වන්නම ලෙස ........................................... වන්නම පිළිගෙන ඇත.

31 සන්නියකුම ශාන්තිකර්මයේ, යක්ෂ සේනාවට අධිපතිත්වය දරන්නේ ................................ සන්නි යක්ෂයා ය.

CamScanner

32 අරාබි කෝපි නැටුම සහ චීන තේ නැටුම යන විශේෂාංග ........................................ බැලේ නාට්‍යයේ අන්තර්ගත වූවකි.

33 නෘත්‍යාංජලී සහ නවාංජලී වැනි නෘත්‍ය ප්‍රසංග නිර්මාණය කිරීම සඳහා ........................................ මහතා දායක වී ඇත.

34 භරත නාට්‍යම්හි තිල්ලානා නර්තන අංගය, කථක් නර්තන සම්ප්‍රදායේ ........................................ අංගයට සමාන වූවකි.

35 කිරිමඩුව ශාන්ති කර්මයේ ප්‍රධාන කපු මහතා හඳුන්වන්නේ ........................................................ ලෙස ය.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.

36 ජස හා අණබෙර කෝලම් සභාවට පිවිසීමේදී භාවිත පද අන්තර්ගත නර්තන අංග වන්නේ,

I. ජස කෝලම ........................................

II. අණබෙර කෝලම ........................................

37 කොසඹෝ දිය නාපු ...... මාත්‍රා 3 + 3 තාල රූපයට ගයන මෙම කවි පදයේ සඳැස්මත් හා ගීමත් සංඛ්‍යාව දක්වන්න.

I. සඳැස්මත් ........................................

II. ගීමත් ........................................

38 නිදි කුමරිය බැලේ නාට්‍යය නිර්මාණය කළ රට හා නර්තන රචකයා නම් කරන්න.

I. රට ........................................

II. නර්තන රචකයා ........................................

39 "පත්තිනි" චිත්‍රපටියේ නර්තනය හා සංගීතය නිර්මාණය කරන ලද්දේ,

I. නර්තනය ........................................

II. සංගීතය ........................................

40 හැට හතරක් ආභරණින් සැරසි ගතේ .... මෙම කවිය අයත් නාට්‍යමය පෙළපාලිය හා ශාන්තිකර්මය නම් කරන්න.

I. නාට්‍යමය පෙළපාලිය ........................................

II. ශාන්ති කර්මය ........................................

41 ඓතිහාසික තොරතුරු අනුව පහතරට සින්දු වන්නම් රචකයා හා මුල්ම ගායකයා නම් කරන්න.

I. රචකයා ........................................

II. මුල්ම ගායකයා ........................................

42 "භරත සතර පෙර ඉසිවර කී ලෙසට" මෙම කවි පදය අයත් සංදේශ කාව්‍යය සහ යුගය දක්වන්න.

I. සංදේශ කාව්‍යය ........................................

II. යුගය ........................................

43 මුද්‍රා නාට්‍ය දිනය හා ලෝක නර්තන දිනය සඳහන් කරන්න.

I. මුද්‍රා නාට්‍ය දිනය ........................................

II. ලෝක නර්තන දිනය ........................................


CamScanner

44 කථක් නර්තනය හා බැඳි සංගීත සම්ප්‍රදායෙහි සමගුණ "ආඩ" ලෙස හැඳින්වෙන අතර දෙගුණ සහ සිව්ගුණ හඳුන්වන සුවිශේෂ නාම දක්වන්න.


I. දෙගුණ ______

II. සිව්ගුණ ______

45 A හා B රූප සටහන් නම් කරන්න.



A



B

I. A ______ II. B ______

46 තොංචි කෝලමේ පද ඇසුරින් නිර්මාණය වූ මුද්‍රා නාට්‍යය හා එහි නිර්මාතෘ නම් කරන්න.

I. මුද්‍රා නාට්‍යය ______

II. නිර්මාතෘ ______

47 අව ග්‍රහ සහ විෂම ග්‍රහ සඳහා ව්‍යවහාර කළ හැකි වෙනත් නාම දෙකකි.

I. අව ග්‍රහ ______

II. විෂම ග්‍රහ ______

48 අටමගලේ කවි හා රත්තෙළඹු කවි භාවිතයට ගනිමින් නිර්මාණය කළ ගැමි නැටුම් දෙකකි.

I. අටමගලේ කවි ______

II. රත් තෙළඹු කවි ______

49 "බෝ කොට මඩුවක් බිම පේ කරති "..... මෙම කවි පදය අයත් අංගය සහ අදාළ ශාන්තිකර්මය නම් කරන්න.

I. අංගය ______

II. ශාන්තිකර්මය ______

50 රාමාට්ටම් හා ක්‍රිෂ්ණාට්ටම් ප්‍රබන්ධ කළ රජවරු නම් කරන්න.

I. රාමාට්ටම් ______

II. ක්‍රිෂ්ණාට්ටම් ______

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2024
# නර්තනය ( දේශීය)

**13 ශ්‍රේණිය** **I කොටස** **පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (1) | 03. (2) | 04. (4) | 05. (4) | 06. (1) | 07. (5) | 08. (5) | 09. (2) | 10. (3) |
| 11. (1) | 12. (2) | 13. (4) | 14. (5) | 15. (3) | 16. (2) | 17. (4) | 18. (1) | 19. (5) | 20. (1) |
| 21. (2) | 22. (3) | 23. (4) | 24. (3) | 25. (5) | | | | | |

26. කිරිමඩුව
27. ගමන් පදය
28. මලිති
29. ආර්නෝල්ඩ් එල් හැස්කෙල්
30. හංසා
31. මහා කෝල
32. නට්ක්‍රැකර්
33. චිත්‍රසේන
34. තරානා
35. කිරි කට්ටඩි
36. I මුගුරු පාලිය II ශුද්ධ මාත්‍රය
37. I 10 II 12
38. I රුසියාව II මාරියස් පෙටිපා
39. I චන්ද්‍රන වික්‍රමසිංහ II රෝහණ වීරසිංහ
40. I ඌරා යක්කම II කොහොඹා කංකාරිය
41. I බරන II දාපුළුසෙන්
42. I සැවුල් II කෝට්ටේ
43. I ජනවාරි 26 II අප්‍රේල 29
44. I කුඅාඩ II බියාඩ
45. I මෘදංගය II සාරංගිය
46. I බැරිසිල් II ආරියරත්න කළුආරච්චි
47. I පෙරතිත II පසුතිත
48. I මෝල්ගස් නැටුම II කුළු නැටුම
49. I කිරි ඉතිරවීම II කිරි මඩුව
50. I කොට්ටාරක්කාර තාම්පුරන් II කැලිකට් හි ජැමොරින්/ සැමොරින්

ලකුණු ප්‍රදානය :

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට = 02 x 50 මුළු ලකුණු = 100

## II පත්‍රය -I කොටස

01. (i)

| ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | කුං | ජිං | ගත් | තරි | කිට | කුං | තක | ත | කුං | ජිං | ගත් | තරි | කිට | කුං | තක |

නිවැරදි සංකේත භාවිතයට ලකුණු = 02
නිවැරදි බෙරපද ප්‍රස්තාර කිරීමට = 04 (ලකුණු 06)

(ii)

| ^1 | 2 | ´1 | 2 | 3 | 4 | ^1 | 2 | ´1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | අක් | - | ක | - | ඉ | - | තින් | - | - | - |
| + | + | නා | - | ඩ | - | න් | - | නේ | - | - | - |
| + | + | එක් | - | ව | - | ගො | - | සින් | - | - | - |
| + | + | අ | ප | එ | - | න් | - | නේ | - | - | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - |

නිවැරදි සංකේත භාවිතයට ලකුණු = 02
නිවැරදි කවි පද ප්‍රස්තාරයට ලකුණු = 04 (ලකුණු 06)

(iii)

| ^ | | ^ | | / | | | ^ | | ^ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | + | + | + | + | තහර් | ජිං | ගත |
| කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| + | + | + | + | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | ගත | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| කහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - | තහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිත් | - |
| කහර් | ජිත් | තහර් | ජිත් | තහර් | ජිං | ගත | කුං | තක | ජිං | කුඳ | ගජ් | ජිං | ගත |
| තරි | කිට | කුං | දත් | තහර් | ජිත් | - | ගත් | - | තත් | - | ත | ක | ට |
| තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | |

නිවැරදි සංකේත භාවිතයට ලකුණු = 02
නිවැරදි අඩව්ව ප්‍රස්තාර කිරීමට = 06 (ලකුණු 08)

02. I. ගම්පොළ යුගය

- ඇම්බැක්කේ දේවාලයේ ලී කණුවල ඇති සිව්රැස් පනේලයක දක්නට ලැබෙන නළඟන රුව
- එහි දැක්වෙන නර්තන විලාසයෙන් දකුණු ඉන්දීය ලක්‍ෂණ පෙන්නුම් කරන බව
- මෙම සාධකය හෝ වෙනත් පුරාවිද්‍යාත්මක සාධකයක් ලියා භාරතීය ලක්‍ෂණ පිළිබිඹු වන ආකාරය සටහන් කර තිබීම. (ලකුණු 03)

කෝට්ටේ යුගය.

- කෑගලු දිස්ත්‍රික්කයේ අම්බුළුගල හා බෙන්තර ගලතුරුමුල විහාර කැටයම් සහිත උළුවස්සේ ඇති නළඟන රුව සම්බන්ධ සාධකය හෝ වෙනත් අදාළ පුරාවිද්‍යාත්මක සාධකයක් තුළින් භාරතීය ලක්‍ෂණ පෙන්නුම් කරන බව ලියා තිබීම. (ලකුණු 03) (මුළු ලකුණු 06)

II.

- මහනුවර යුගයේ කවිකාර මඩුව ගායනය, වාදනය හා සංගීතය සඳහා සුවිශේෂ ස්ථානයක් වනබව
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සමයේ රම්මොලවක අධිකාරම හා ගණිතාලංකාර බමුණු පඬිවරයා උඩරට වන්නම් රචනා කළ බව.
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු කවිකාර මඩුවේ නර්තනය සඳහා ශෘංගාලංකාරය ගායනා කරවූ බව
- ප්‍රශස්ති කාව්‍ය නිර්මාණය වූ බව
- පරංගි හටන, ඉංග්‍රීසි හටන ආදී කවි පොත් කිහිපයක් මහනුවර යුගයේ කවිකාර මඩුවේදී නිර්මාණය වූ බව.
  යනාදී කරුණු හෝ වෙනත් අදාල කරුණු තුළින් මහනුවර යුගයේ කවිකාර මඩුවෙන් ලැබුණු සේවාව ලියා තිබීම. (ලකුණු 06)

III 1970 සිට 1990 දක්වා දේශිය නර්තන කලාවේ ප්‍රවර්ධනය සිදුවූ ආකාරය

- 1972 වර්ෂයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවස්ථාවේ සෞන්දර්ය විෂය කමිටු වාර්තාව අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගය සඳහා සෞන්දර්ය විෂය අනිවාර්ය වීම.
- 1972 වර්ෂයේ ගිරාගම ගුරු විද්‍යාලය ආරම්භ වීම.
- 1978 වර්ෂයේදී අ. පො. ස. (උ. පෙළ) විෂය ධාරාවට සෞන්දර්ය විෂය ඇතුළත් වීම.
- 1974 කැලණි විශ්ව විද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය නමින් ප්‍රති සංවිධානය වීම.
- 1986 ජාතික අධ්‍යාපන ආයතනය යටතේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව බිහි වීම.
  ආදී වර්ෂ වලදී දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනය සිදු වූ ආකාරය කරුණු හතරක් තුළින් ලියා තිබීම (ලකුණු 08) (මුළු ලකුණු 20)

03. I. කිරිමඩු ශාන්ති කර්මයේදී සාම්ප්‍රදායික ඇඳුම් කට්ටල භාවිතා කරන අතර එක් එක් අවස්ථාවන්ට අනුව සුළු සුළු වෙනස්කම් සිදුවන බව.

- පන්දම් නැටීමේදී සාම්ප්‍රදායික අත්කොට පබළු හැට්ටය වෙනුව අත් දිග රතු හැට්ටය අඳින ලද බව.
- හිසට නෙත්ති මාලය වෙනුවට සුදු රෙද්දක් බඳින ලද බව.
- ඇත්බන්ධන, මී බන්ධන අවස්ථාවලදී කොළපතකින් සකස්කළ තාවකාලික වෙස්මුහුණක් පලදා හිසට රෙද්දක් බැඳගන්නා බව.
- ගත සුදු රෙද්දකින් වසා වලිගය සඳහා අඹරාගත් සුදු රෙද්දක් අගට පුවක් මල් ඉත්තක් බඳින ලද බව .... දක්වා විස්තර කර ඇත්නම්. (ලකුණු 06)

II. ● <u>ඇඹුම් ක්‍රම</u>

- ආතුර නිවසට උතුරින් ඇති තුඹසකින් හුඹස් මැටි ලබාගන්නා බව
- සඳුන් කිරිපැන් ඉස මැටි පේ කර ගන්නා බව
- බලි සඳහා නේත්‍රා තැබීම ද සිදුකරන බව දක්වා තිබීම.
- බලි මැස්ස සකස් කර එම මැස්ස මත බලි ඇඹීම සිදුකරන බව. (ලකුණු 03)

● වර්ණ ගැන්වීම

- ස්වාභාවිකව යොදාගන්නා අමුද්‍රව්‍ය භාවිතාකර බලි වර්ණ ගැන්වීම සිදුකරන බව
- පොල්කටු අඟුරු, ගුරු ගල්, මකුළු මැටි(කිරි මැටි) කොළවර්ගවල යුෂ, කහ කුඩු, නිල් කුඩු, වැනි ද්‍රව්‍ය භාවිතා කරන බව
- එක් එක් ග්‍රහයින් සඳහා විවිධ වර්ණ භාවිතා කරන බව දක්වා තිබීම. (ලකුණු 03)

III. ● කපුයක්කාරිය නාට්‍යමය අවස්ථාවේදී

- නාට්‍යමය අවස්ථාවෙන් පවුල් සංස්ථාව තුළ වූ සමගිය තුළින් යහපත් ගුණාංග ප්‍රගුණ කෙරෙන බව, ස්වාමියාගේ හැඩ රුව පිළිබඳ කථා කිරීම, ගෙදර දොර වැඩ වලට ස්වාමියාගේ සහය නොමැති බවත්, ඔහුගේ දුර්වලතා පිළිබඳ කෙරෙන සංවාද තුළින් පවුල් සංස්ථාවේ සමගිය සුහද බව තුළ යහගුණය වර්ධනය කරගත හැකි බව දක්වා තිබීම.
- ආගමික විශ්වාස සමාජය තුළ නිර්මාණය වීම තුළින් සමගිය, සහජීවනය ගොඩනැගෙන බව
- කපු හේන වවා, නොඉදුල් සළුවක් පූජා කිරීම, දක්වා කෙරෙන නිරූපණ, සැමියා සමග සුහදව කවි ගායනා හා සංවාද තුළින් ව්‍යාංගයෙන් දරු උපතක් පිළිබඳ අදහස් දැක්වෙන බවත් ඉන් සමාජ සහජීවනය වර්ධනය සිදුවන බවත් දක්වා තිබීම.
- ඒ තුළින් සමාජයට ම යහපතක් සැලසෙන බව දක්වා තිබීම (කරුණු හතරක් තුළින් විස්තර කිරීම) (ලකුණු 08)

04. I.

- දිය කපා පෙරහැර අවසන් වීමෙන් පසු දෙවියන්ට පිං දීම හා විෂ්ණු දේවාලය ඒ සඳහා තෝරා ගැනීම
- දළදා වහන්සේට ගෞරව කිරීමක් වශයෙන් පෙරහැර පැවැත්වෙන බව.
- ඇසළ පෙරහැර සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ නිලමේ වරුන් ප්‍රමුඛ, දළදා මාලිගයට අයත්, ඇතුළු කට්ටලයේ සහ පිට කට්ටලේ, සියලු නිලධාරීන් පෙරහැරේ ගමන්ගත් අලි ඇතුන්, ශිල්පීන් නරඹන්නන් ආදීන්ට සෙත් පැතීම සඳහා සියලු වස් දොස් දුරුකර වලියකුන් ප්‍රධාන දෙවියන්ට සත්දිනක් පූජා පැවැත්වීම.
- ආරම්භක චාරිත්‍ර හා පිරිත් හුයේ කවි ගායනා, පරහද ගැම, තුළින් ආගමික පසුබිම විස්තර කිරීම.
- සත්වැනි දින අවසානයේ වස්දොස් හැරීමේ චාරිත්‍රයේදී නර්තන ශිල්පීහු නවකොළ අත්ත ගෙන රජු(ආතුරයා) ස්පර්ශ කරමින් ''සකල ශරීරයේ දෝෂ දුරු වේවායි'' සෙත් කරන බව.
- බෞද්ධ ඇදහිලි හා දේව ඇදහිලි මූලිකව ආගමික වත් පිළිවෙත් සිදුකරමින් මෙහි අරමුණු සාක්ෂාත් කරගන්නා බව දක්වා තිබීම. (ලකුණු 06)

II.

- සන්නියකුමේ සංබපාල හා දංඋදියාගේ කථාව ඇසුරින් මේ පිළිබඳ දැක්විය හැකි බව.
- සංබපාල කථාවේ අයහපත් ක්‍රියාවන් ලෙස බොරු කීම, කේලාම් කීම, කේලම් ඇසීම, ඊර්ෂ්‍යාව, වෛරය, පලිගැනීම වැනි සිතිවිලි වලින් සමාජ ව්‍යසනයන් සිදුවන බව දක්වා තිබීම.
- දං උදියාගේ කථාව ඇසුරින් සමාජය මුලාකිරීම රැවටීම වැනි පාප ක්‍රියාවන්හි නිරත වීමෙන් අයහපත් පල විපාක ලැබෙන බව.
- ඒ තුළින් පවුල් සංස්ථා බිඳ වැටීම්, මාතෘත්වයේ මානසික අසහනය සන්නි චරිත බිහිවීමෙන් සාරධර්ම ගිලිහී සමාජ ව්‍යසනයන් සිදුවන බව පෙන්වා තිබීම. (ලකුණු 06)

III. පොත්කඩේ යක්කම

- වාචික අභිනය ප්‍රධාන තැනක් ගන්නා අතර ආංගික සාත්වික අභින අඩුවැඩි වශයෙන් යොදාගෙන චරිත නිරූපණය සිදුකෙරෙන බව.
- නෙල්ලි කොත්තුවා හෙවත් අතෝරකරු රංගන කාර්යයට දායක වූවත් සංවාද සඳහා සහභාගී කර නොගන්නා බව
- හාස්‍ය රසය දනවීම සඳහා ප්‍රේක්ෂකයා වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව.
- ඒ තුළින් ප්‍රේක්ෂක අවධානය සංවාද වෙත ඇඳ බැඳ තබා ගැනීමට ශාන්තිකර්ම ශිල්පියා සමත්වී තිබෙන ආකාරය දක්වා තිබීම.
- අධික වර්ෂාව නිසා ගොයම දියවී යාම අලකොළ රෝගය ලෙසත් අධික නියගය නිසා පොළොව ඉරිතලා යාම, පෝෂණය නොමැති කමින් ගොයම හැකිළී යාම, පොල්කටු රෝගය ලෙසත් ප්‍රකාශ වන අතර එම රෝග ස්ත්‍රීන්ට වැලදෙන රෝග ලෙස පැවසීමෙන් හාස්‍ය රසය මෙම නාට්‍යය අවස්ථාවේදී උද්දීපනය වන බව....... ආදී ලෙස කරුණු 04ක් ගෙනහැර ඇත්නම්

(ලකුණු 08)

05 I. ජීවන වෘත්තීන් පිළිබිඹුවන ගැමි නර්තන ලෙස ගොයම්, මෝල්ගස්, කුළු, පන්නෙලීම ආදී නර්තන අංග 04ක් නම්කර තිබීම. (ලකුණු 02)

- එම නැටුම් තුළ සහයෝගීතාව, ආගමික විශ්වාස, පදනම්ව ඇති බව.
- ගැමි කාර්යන්හි දී කෘෂි කර්මාන්තය, පන් කර්මාන්තය ආදී ලෙස එන අවස්ථාවන්හිදී සිදුකරනු ලබන ක්‍රියාවන් ඉතා සූක්ෂම ලෙස එම නර්තන අංගයන්හි දක්නට ලැබෙන බව.
- කුල්ල, මෝල්ගස, දෑ කැත්ත ආදී ගෘහ උපකරණයන් රංගන කාර්යය සඳහා යොදා ගන්නා බව.
- මෙම නර්තන අංග සඳහා යොදා ගන්න කවි, ගායනා, වාදන ආදිය තුළින් ඉතා සූක්ෂමව එම ගැමි කාර්යයන් පෙන්වා දෙන බව.
- එම ගායනා තුළින් සහයෝගීතාවය, සමගිය, එකමුතුබව, ගැමි සංස්කෘතිය විදහාපාන බව දක්වා ඇත්නම්
- "නැනෝ නුඹත් එනවද පන් නෙලන්නට"
  කවුද නගේ දරුවට කිරිපොවන්නට" ආදී කවි ගායනා තුළ අන්‍යෝන්‍ය සුහද බව පිළිබිඹු වීම නිදසුන් ලෙස පෙන්වා තිබීම.
- වෘත්තීන් හා බැඳි ගැමි නැටුම් දෙකක් විස්තර කිරීම (ලකුණු 04) (මුළු ලකුණු 06)

II.
- සිංහලඃ ලී, ගොයම්, කළ
  ද්‍රවිඩඃකෝලාට්ටම්, අරිච්චෙට්ටු, චෙම්බු ආදී ලෙස
  ගැමි නැටුම් වර්ග දෙක නම් කිරීමට (ලකුණු 02)
- එහි ආගමික පසුබිම දක්වා තිබීම
  - ✶ දේව භක්තිය ප්‍රකිශිත බව.
  - ✶ දේව ආශිර්වාද ලබාගන්නා බව හා අදහන දේව කොට්ඨාස පිළිබඳ දක්වා තිබීම.
  - ✶ පූජා නර්තන ලෙස එම නර්තනයන් යොදාගන්නා බව (කෝලාට්ටම්, ලී කෙලි නර්තන අංග වලදී)
  - ✶ ලී කෙළි නර්තනයේදී කතරගම දෙවියන්ට සිදුකෙරෙන වන්දනාමානයක් ලෙස යොදාගෙන ඇතිබව දක්වා තිබීම.
  - ✶ "කදිරපුරේ යකුකඩවර ...." ලෙස ලියා ඇත්නම්
  - ✶ ආගමික පසුබිමට අදාළ කරුණු ඇසුරින් විස්තර කිරීමට (ලකුණු 04) (මුළු ලකුණු 06)

III. <u>ජස කෝලම</u>

- කුල හීන සමාජ චරිත පිළිබඳ අදහස් දක්වන බව.
- සුරාව තුළින් සිදුවන අනිටු විපාක පෙන්වා දෙන බව.
- අඹුසැමි සබඳතාවයන්හි ඇති ගැටීම් තුළින් පවුල් සංස්ථාවේ ඇති නොසන්සුන් බව.
- බහු විවාහය සමාජයේ නොගැළපෙන කරුණක් බව පෙන්වා තිබීම
- බයාදු බව මෙනම, උඩඟුකම, ආත්ම වර්ණනාව ආදිය තුළින් සිදුවන අයහපත පෙන්වා දෙනබව විස්තර කර සමාජ ශෝධනය සිදුවන බව ලියා ඇත්නම්
- චරිතය හඳුනා විස්තර කිරීමට (ලකුණු 04)

<u>මුදලි කෝලම</u>

- ප්‍රභූ පංතියේ ඇති ලක්ෂණ පෙන්නුම් කරන බව
- රාජකාරිය සිදුකිරීමේදී එය නිසි අයුරින් සිදු නොකෙරෙන බව
- උඩගුකම හා මාන්නාධිකකම තුළින් සිදුවන සමාජ පරිහානිය පෙන්වා දිය හැකි බව.
- අල්ලස, කාන්තා ලොල් බව, සමාජයේ නුසුදුසු ක්‍රියාවන් බව පෙන්වා තිබීම
- අසාධාරණ තීන්දු ලබා දීම තුළ සිදු කෙරෙන සමාජීය ව්‍යසනයන් පිළිබඳව දක්වා තිබීම.

  චරිතය හඳුනා කරුණු විස්තර කිරීමට (ලකුණු 04) (මුළු ලකුණු 08)

06. (අ) කොටස

I. පඛ්වාජ් - වාද්‍ය භාණ්ඩය හඳුනා ගැනීමට (ලකුණු 01)

- මෝගල් සමයෙහි කථක් නර්තන සම්ප්‍රදාය හා බැඳි ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය බව
- පඛ්වාජ් යන්නෙහි අර්ථය ලියා ඇති බව
- මෙම වාද්‍ය භාණ්ඩයෙහි දෙඇස ප්‍රමාණ දෙකකින් යුක්ත වන බව.
- බෙර ඇස්වල විශ්කම්භය දක්වා තිබීම ආදී කරුණු හා වාද්‍ය භාණ්ඩය නිර්මාණය කර ඇති ආකාරයත එහි සුවිශේෂතා හා රූප සටහනක් ද ඇඳ විස්තර කර තිබීම.

(ලකුණු 05) (මුළු ලකුණු 06)

II. භරත නාට්‍යයම් සම්ප්‍රදායට අයත් නර්තන අංගය වර්ණම් ලෙස තෝරා ගැනීම. (ලකුණු 02)

- නර්තන ශිල්පිනිය දක්ෂිණ භාරතීය මනාලියකගේ ස්වරූපයෙන් සැරසෙන බව
  අතීතයේදී තුයියා සේලය භාවිතාකර ඇති බව
  රංග වස්ත්‍ර කට්ටල තුනක් භාවිතා කරන බව හා එය කෙටියෙන් විස්තර කර තිබීම.
  භරත නාට්‍ය ශිල්පියාගේ ඇඳුම පිළිබඳව සටහන්කර තිබීම.
  ශිල්පියා හා ශිල්පිනිය පළඳිනු ලබන ආභරණ දක්වා තිබීම යනාදී කරුණු තුළින් පිළිතුරු ලියා තිබීම. (ලකුණු 04) (මුළු ලකුණු 06)

III. බටහිර බැලේ නර්තන අංගය හංස විල ලෙස සටහන් කර තිබීම (ලකුණු 10)

- රංග රචනය හා සංගීත ශිල්පීන් හඳුනාගෙන තිබීම.
- සංගීතය පීටර් චෙයිකොස්කිව් ලෙස හඳුනාගෙන තිබීම
- සංගීතය නර්තනයට උචිත අයුරින් නිර්මාණය කර තිබීම
- හංසවිල බැලේ නාට්‍යයේ සංගීතය රුසියානු ගැමි සංගීත කලාව තුළින් ගොඩනගා ගෙන ඇති බව.
- සංගීතය සඳහා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස පියානෝව භාවිතා කිරීම
- අමතරව වයලින්, චෙලෝ, ගිටාර්, වැනි තත් වාද්‍ය භාණ්ඩ සංගීතය නිර්මාණය කිරීම සඳහා යොදා ගැනීම
- නිර්මාණශීල සංගීතය (සිම්පනි හා ඔපෙරා) හංසවිල බැලේ නාට්‍යයේ සාර්ථකත්වයට හා ජනප්‍රියත්වයට බලපා ඇති බව
- රංග රචන ශිල්පියා මාරියස් පෙටීපා ලෙස නම් කිරීම.
- පෙටිපාගේ රංග රචනයෙන් හංසවිල ලෝක ප්‍රකට කෘතියක් ලෙස පිළිගත් බව
- හංස රංගනවල දක්නට ලැබෙන සුවිශේෂ පාද චලන චමත්කාර ජනක ලෙස නිර්මාණය කර තිබීම.
- සංගීතයට ගැලපෙන අයුරින් නර්තන නිර්මාණය කර තිබීම.
- එක් එක් ජවනිකා තුල දක්නට ලැබෙන පැනීම්, කැරකීම් සඳහා අවකාශය භාවිතා කර ඇති ආකාරය පිළිබඳව දක්වා තිබීම.
- හංසවිල බැලේ නාට්‍යයේ සම්භාව්‍ය ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා රංග රචනය තුළින් දායකත්වයක් ලබාදුන් බව.......

  යනාදි කරුණු හෝ වෙනත් අදාල කරුණු තුලින් පිළිතුරු ලියා තිබීම. (ලකුණු 08)
  ශිල්පීන් දෙදෙනා හඳුනා ගැනීමට (ලකුණු 01)
  විස්තර කිරීමට (ලකුණු 06)
  (මුළු ලකුණු 20)

07. I. රංගාලෝකය

- උපාසක අම්මලාගේ මුහුණේ ඉරියව් මතුකර පෙන්වීම සඳහා රංගාලෝකයේ අනුභාව ලබාගෙන ඇතිබව.
- බැරිසිල් මුද්‍රානාට්‍යයේ තේමාවට උචිත පරිදි සාමාන්‍ය ආලෝක ධාරා යොදාගෙන ඇති බව.
- පසුතල දර්ශන මැවීමේදී රංගාලෝකයේ සහය ලබා ගැනීම
- අළුයම, උදෑසන, රාත්‍රිය මැවීමේදී අවශ්‍යතා අනුව ආලෝකය යොදා ගැනීම (ලකුණු 03)
  තාක්ෂණික උපක්‍රම
- බැරිසිල් මුද්‍රා නාට්‍යයේ නව සංගීත සංයෝජනය සඳහා තාක්ෂණය භාවිතා කිරීම
- හාමුදුරුවන් සංකේතවත් කිරීමේදී වටාපත ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කිරීම.
- උපාසකම්මලා නිදිකිරා වැටෙන හඬ, එක් උපසාක අම්මා කෙනෙකු වාතය පිටකරන හඬ, මදුරුවන්ගේ හඬ, ඕරලෝසුවේ කටුවල හඬ, ............
  ආදිය සඳහා තාක්ෂණික උපක්‍රම මුසුකර ඇති බව. (ලකුණු 03)
  ඉහත කරුණු ඇසුරෙන් පිළිතුරු ලියා තබීම. (ලකුණු 06)

II.
- දේශීය වාද්‍ය භාණ්ඩ වන ගැටබෙරය, යක් බෙරය, දවුල, රබාන, උඩැක්කිය, හොරණෑව, තාලම්පට, පන්තේරුව ආදිය නර්තන නිර්මාණ සඳහා යොදා ගැනීම
- බටනලාව, තබ්ලාව, මෘදංගය, සිතාරය, වයලීනය වැනි භාරතීය වාද්‍ය භාණ්ඩයන්හි හඬ නර්තනාංග සඳහා සුසංයෝග කර ගැනීම.
- බටහිර සංගීත භාණ්ඩවල හඬ මගින් නර්තන නිර්මාණවල ප්‍රාසංගික ගුණය ඉස්මතුකර ගන්නා බව.
- දේශීය ජන සංගීතය ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ පෝෂණයට ලබා දී ඇති දායකත්වය.
- ශාන්තිකර්ම, දේශීය ගැමි නැටුම්වල ගායනා නාදමාලා එම නර්තනාංග සඳහා යොදා ගැනීම තුළින් ප්‍රාසාංගික ගුණය තීව්‍ර වන බව.
- අද්‍යතන නර්තන සඳහා පටිගත සංගීතය භාවිතය
  ආදී වශයෙන්, දේශීය ජනසංගීතය, භාරතීය සංගීතය හා බටහිර සංගීතය තුළින් ලබා ඇති පෝෂණය කරුණු 3ක් මගින් විස්තර කර ඇත්නම් (ලකුණු $3 \times 2 = 6$)

III. පෙරදිග-

- භාරතීය ශාස්ත්‍රිය ඇඳුම් පැළඳුම් ඇසුරින්
- භාරතීය ගැමි නැටුම්වල රංග වස්ත්‍රාභරණ ඇසුරින්,
- භාරතීය ද්‍රවිඩ හා හින්දි ගීතවල රංග වස්ත්‍රාභරණ ඇසුරින් විචිත්‍ර වූ වෛර්ණ රෙදි යොදා ගැනීම.
- විසිතුරු ගල්, පබළු, වීදුරු කැලි, භාරතීයමාල, වළලු කරාබු, තැලි ආදිය භාවිතය
- කථකලි, ඔඩිසි ආදී නර්තනවල හිස් පළඳනා අනුව දේශිය හිස් පළඳනා සැකසීම. (ලකුණු 04)

අපරදිග

- බැලේ නාට්‍යවල රංග වස්ත්‍රාභරණ ඇසුරින් ඇඳුම් නිර්මාණය සරල, දුහුල්, විනිවිද පෙනෙන රංග වස්ත්‍ර භාවිතය
  කොට සාය, ලියෝටාඩ් ඇඳුම වැඩිපුර භාවිතය
  මේස්, පාවහන් සහ සපත්තු පැළඳීම
  ඇඟට ඇලුණු රංග වස්ත්‍ර නිර්මාණය කිරීම. (ලකුණු 04) (මුළු ලකුණු 08)

08. I.
- රූපවාහිනි නාලිකාවල විකාශනය වන රියැලටි නර්තන වැඩසටහන් තුනක් නම්කර තිබීම.
  උදාඃ- සුපර් ඩාන්සර් (හිරු)
  ලිට්ල් ස්ටාර් (දෙරණ) ආදී වැඩසටහන් නම්කිරීමට (ලකුණු 03)
- මෙම වැඩසටහන් සඳහා විදේශීය ආභාෂය බලපා ඇති ආකාරය ලියා තිබීම.
- ශරීරයේ චලන නිසි ආකාරව දිශා ගත වන බව.
- රටා, හැඩතල, භාවිතයෙහි ඇති විශේෂතා
- බටහිර හා භාරතීය රංග විධික්‍රම භාවිතා කර ඇති බව යනාදී ලෙස ලියා තිබීම (ලකුණු 03)

(ලකුණු 06)

II.
- චිත්‍රකලාවේ මූලිකාංග වන වර්ණ. රේඛා, හැඩතල හා අවකාශය ආකෘතිය බව සටහන් කර තිබීම.

- චිත්‍ර කලාවේ රේඛා, හැඩතල හා වර්ණ ප්‍රධාන මාධ්‍ය වශයෙන් නර්තන කලාවට සම්බන්ධ වන බව.
- නර්තනයේ භාවිත ඇඳුම් පැළඳුම් රංග උපකරණ පසුතල දර්ශන රංග භූමි අලංකරණය සඳහා චිත්‍ර කලාවේ වර්ණ රේඛා හැඩතල යොදා ගන්නා බව.
- අංග රචනය සඳහා ද චිත්‍ර කලාවේ මූලිකාංග යොදා ගන්නා බව
  ආදී කරුණු හෝ වෙනත් අදාල කරුණු තුළින් පිළිතුරු ලියා තිබීම. (ලකුණු 06)

III.
- විවිධ රටවල නර්තන ක්‍රම අන්තර්ජාලය හරහා අනුකරණයට යොමු වී ඇති බව
- ලෝකයේ විවිධ සංස්කෘතිකාංග නැරඹීම නිසා දේශීය නර්තනයේ අනන්‍ය බව ගිලිහී යාම
- ගෝලීයකරණය නිසා තාක්ෂණික දියුණුව ඇති වූ බව
- ප්‍රාසංගික බව උද්දීපනය කිරීම සඳහා විවිධ වූ ආනුශාංගික අංග භාවිතා කල බව යනාදී කරුණු හෝ වෙනත් අදාල කරුණු තුලින් පිළිතුරු ලියා තිබීම. (ලකුණු 08)

(මුළු ලකුණු 20)